තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය

# ජාතික තරුණ සේවා සභාව

# ඇබෑර්තු

තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික තරුණ සේවා සභාවේ පහත තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. ප්‍රධාන අභ්‍යන්තර විගණක - (HM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

- අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් වාණිජ්‍ය / ගණකාධිකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

(i). අදාළ ක්ෂේත්‍රයකින් ලබාගත් පිළිගත් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

හෝ

(ii). ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. **(ICASL)**

හෝ

(iii). වරලත් ගණකාධිකාරින්ගේ කළමනාකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. **(CIMA)**

හෝ

(v). සහතිකකල සහ සමායතන ගණකාධිකාරින්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. **(ACCA)**

සහ

(ආ) උපාධිය/ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / පිළිගත් වාණිජ ආයතනයක, කළමනාකාර මට්ටමේ මූල්‍ය / ගිණුම් පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර පහළොවක (15) පලපුරුද්දක් ලබා තිබීම.

**2. අධ්‍යක්ෂ (සංවර්ධන) - (HM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01 - (කොන්ත්‍රාත් පදනමින්)**

- අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

**අධ්‍යාපනික සහ වෘත්තීය:**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **ඕනෑම උපාධියක්** ලබා තිබීම.

**සහ**

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක් (Masters)** ලබා තිබීම.

**සහ**

(ඇ) ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / පිළිගත් වානිජ ආයතනයක **කළමනාකාර මට්ටමේ තනතුරක, තරුණ සේවා සංවර්ධනය / ප්‍රජා සංවර්ධනය / සමුපකාර කටයුතු / ග්‍රාම සංවර්ධනය/ කෘෂිකර්ම සංවර්ධනය / ගොවිපොළ සංවර්ධනය / තරුණ බලගැන්වීම් / ආදායම් ප්‍රවර්ධනය පිළිබඳ ක්ෂේත්‍රයෙහි** අවම වශයෙන් **වසර පහළොව (15) ක සේවා පළපුරුද්දක්** ලබා තිබීම.

- වයස් සීමාව

❖ අවුරුදු 35 ට නොඅඩුව හා අවුරුදු 55 ට නොවැඩි අය විය යුතුය.

- **HM 1-1 -** වැටුප් හා දීමනා.

**HM 1-1 – 01/2025 : රු: 140,640 – 15 X 4,100 – 202,140/-**

**3. සහකාර අධ්‍යක්ෂ (මුදල්) - (MM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

- අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

(අ) **(i)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **වාණිජ / ගණකාධිකරණය පිළිබඳ (සිංහල මාධ්‍ය / දෙමළ මාධ්‍ය) උපාධියක්** ලබා තිබීම.

හෝ

**(ii)** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම. **(ICASL-Intermediate Level).**

හෝ

**(iii)** වරලත් ගණකාධිකාරින්ගේ කළමනාකරණ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම**. (CIMA).**

හෝ

**(iv)** සහතිකකල සමායතන ගණකාධිකාරින්ගේ සංගමයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබිම. **(ACCA).**

හෝ

**(v)** රජයේ කාර්මික විද්‍යාලයක ගණකාධිකාරණය පිළිබඳ **උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය** ලබා තිබීම.

සහ

(ආ) උපාධිය හෝ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / පිළිගත් වාණිජ ආයතනයක, මූල්‍ය / ගිණුම් කටයුතු පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් **වසරක (01) සේවා පළපුරුද්දක්** ලබා තිබීම.

**4. අභ්‍යන්තර විගණක - (MM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

- අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

(අ) **(i)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **වාණිජ / ගණකාධිකරණය පිළිබඳ (සිංහල මාධ්‍ය / දෙමළ මාධ්‍ය) උපාධියක්** ලබා තිබීම.

හෝ

**(ii)** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම. **(ICASL-Intermediate Level).**

හෝ

**(iii)** වරලත් ගණකාධිකාරින්ගේ කළමනාකරණ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම**. (CIMA).**

හෝ

**(iv)** සහතිකකල සමායතන ගණකාධිකාරින්ගේ සංගමයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබිම. **(ACCA).**

හෝ

**(v)** රජයේ කාර්මික විද්‍යාලයක ගණකාධිකාරණය පිළිබඳ **උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය** ලබා තිබීම.

සහ

(ආ) උපාධිය හෝ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / පිළිගත් වාණිජ ආයතනයක, අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් **වසරක (01) පළපුරුද්දක්** ලබා තිබීම.

**5. ඉංජිනේරු (සිවිල්) - (MM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

- අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **සිවිල් ඉංජිනේරු උපාධියක්** ලබා තිබීම.

සහ

(ආ) උපාධිය හෝ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / පිළිගත් වාණිජ ආයතනයක, සිවිල් ඉංජිනේරු කටයුතු පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් **වසරක (01) පලපුරුද්දක්** ලබා තිබීම.

- වයස් සීමාව

❖ අවුරුදු 22 ට නොඅඩුව හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- **MM 1-1 -** වැටුප් හා දීමනා.

**MM 1- 1 – 01/2025 : රු: 91,690 – 10 X 2,480 – 15 X 3,450 – 168,240/-**

**6. කාර්මික නිළධාරි - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 02**

- අධ්‍යාපන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **යාන්ත්‍රික ඉංජිනේරු උපාධියක්** ලබා තිබීම.

**7. ප්‍රසම්පාදන නිළධාරි - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

- අධ්‍යාපන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **උපාධියක්** ලබා තිබීම. විෂයක් වශයෙන් සැපයීම් ඇතුලත් වීම.

**8. මූල්‍ය නිළධාරි - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 08**

- අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

**(i)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **වාණිජ / ගණකාධිකරණය පිළිබඳ (සිංහල / දෙමළ මාධ්‍ය) උපාධියක්** ලබා තිබීම.

හෝ

**(ii)** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටමට** සමත්ව තිබීම. **(ICASL-Intermediate Level)**

හෝ

(iii) වරලත් ගණකාධිකාරින්ගේ කළමනාකරණ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටමට** සමත්ව තිබීම **(CIMA).**

හෝ

(iv) සහතික කළ සහ සමායතන ගණකාධිකාරින්ගේ සංගමයේ **අන්තර් මධ්‍ය මට්ටමට** සමත්ව තිබීම. **(ACCA).**

හෝ

(v) රජයේ කාර්මික විද්‍යාලයක ගණකාධිකරණය පිළිබඳ **උසස් ජාතික ඩිප්ලෝමා සහතියක්** ලබා තිබීම.

**9. අභ්‍යන්තර විගණන නිළධාරී - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 03**

- අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **වාණිජ / ගණකාධිකරණය පිළිබඳ උපාධියක්** ලබා තිබීම.

හෝ

(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම. **(ICASL-Intermediate Level)**

හෝ

(iii) වරලත් ගණකාධිකාරින්ගේ කළමනාකරණ ආයතනයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම **(CIMA).**

හෝ

(iv) සහතික කළ සමායතන ගණකාධිකාරින්ගේ සංගමයේ **අන්තර් මධ්‍ය මට්ටම** සමත්ව තිබීම. **(ACCA).**

හෝ

(v) රජයේ කාර්මික විද්‍යාලයක ගණකාධිකරණය පිළිබඳ **උසස් ජාතික ඩිප්ලෝමා සහතියක්** ලබා තිබීම.

- වයස් සීමාව

❖ අවුරුදු 22 ට නොඅඩුව හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- **JM 1-1 -** වැටුප් හා දීමනා.

**JM 1- 1 – 01/2025 : රු: 72,650 – 10 X 1,360 – 18 X 2,040 – 124,330/-**

**10. භාෂා පරිවර්තක - (MA - 4) - පුරප්පාඩු සංඛ්‍යාව 01 - (වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත)**

- අධ්‍යාපන සුදුසුකම් - පහත **"අ" හෝ "ආ" හෝ "ඇ"**

(අ). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් **සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව ඇතුළු සාමාන්‍ය උපාධියක් හෝ විශේෂ උපාධියක්** ලබා තිබීම.

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ඕනෑම උපාධියක් ලබා තිබීම සමඟ විකල්ප ප්‍රතිපත්ති මධ්‍යස්ථානය විසින් **"විභාෂා පරිවර්තන වැඩසටහන"** යටතේ මෙහෙයවන පරිවර්තන අධ්‍යයන පාඨමාලාවක් හදාරා තිබීම

හෝ

(ඇ). ඉහත තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයකින් අන්තර් මධ්‍යම පරික්ෂණය සමත් වීම.

- වයස් සීමාව

❖ අවුරුදු 22 ට නොඅඩුව හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- **MA -4 -** වැටුප් හා දීමනා.

**MA - 4 – 01/2025 : රු : 64,320 – 10 X 1,360 – 15 X 1,670 – 5 X 2,040 – 113,170/-**

**11. වීඩියෝ කැමරා ශිල්පී - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 02 - (වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත)**

- අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, **රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන, තාක්ෂණ ක්ෂේත්‍රයට** අදාළ ජාතික වෘත්තිය යෝග්‍යතා **(NVQ) 05** වන මට්ටමට නොඅඩු, **ඩිප්ලෝමා සහතිකය** ලබා තිබිම.

**12. වීඩියෝ සංස්කාරක - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 02 - (වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත)**

- අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, **( Diploma in Linear and Nonlinear Editing)** ජාතික වෘත්තිය යෝග්‍යතා **(NVQ) 05** වන මට්ටමට නොඅඩු, **ඩිප්ලෝමා සහතිකය** ලබා තිබිම.

**13. සහකාර නිෂ්පාදක - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01 - (වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත)**

- අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, **ලේඛන කලාව සහ සන්නිවේදන (Writer Ship and Communication) ක්ෂේත්‍රය**ට අදාළ ජාතික වෘත්තිය යෝග්‍යතා **(NVQ) 05** වන මට්ටමට නොඅඩු, **ඩිප්ලෝමා සහතිකය** ලබා තිබිම.

**14. කාර්මික සහකාර (විද්‍යුත් / සිවිල් / විදුලි) - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 03 - (වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත)**

- අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

**(i). කාර්මික සහකාර (සිවිල්)**

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, **සිවිල් ක්ෂේත්‍රයට අදාළ** ජාතික වෘත්තිය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, සහතිකයක් ලබා තිබිම.

**(ii). කාර්මික සහකාර (විදුලි)**

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, **විදුලි ක්ෂේත්‍රයට අදාළ** ජාතික වෘත්තිය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, සහතිකයක් ලබා තිබිම.

**(iii). කාර්මික සහකාර (විද්‍යුත්)**

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, **ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයට අදාළ** ජාතික වෘත්තිය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, සහතිකයක් ලබා තිබීම.

**15. පරිගණක චිත්‍රක නිර්මාණ ශිල්පී - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 02 - (වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත**

- අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පයට** අදාළව පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පය විෂයක් වශයෙන් ඇතුලත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) පහ (05)** වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- වයස් සීමාව

❖ අවුරුදු 18 ට නොඅඩුව හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- වැටුප් හා දීමනා.

**MA 2-1 – 01/2025: රු: 50,540 – 10 X 540 – 07 X 630 – 04 X 890 – 20 X 1,190 – 87,710/-**

**16. කළමනාකරණ සහකාර - (MA 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 40**

- අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

(අ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

I. සිංහල / දෙමළ
II. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

සහ

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන (03) ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**<u>තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්</u>**

පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ මාස හයකට (06) නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම.

**17. සහකාර තරුණ සේවා නිළධාරී - (MA 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 76**

- අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

(අ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

I. සිංහල / දෙමළ
II. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

සහ

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන (03) ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

- වයස් සීමාව

❖ අවුරුදු 18 ට නොඅඩුව හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- වැටුප් හා දීමනා.

**MA 1-1 – 01/2025: රු: 46,220 – 10 X 540 – 07 X 630 – 04 X 890 – 20 X 1,190 – 83,390/-**

**18. රියදුරු - (PL -3) - පුරප්පාඩු සංඛ්‍යාව 17**

- සුදුසුකම්

(අ). අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් **සම්මාන දෙක (02)ක් සහිතව විෂයයන් හය (06)** කින් සමත් වී තිබිය යුතුයි.

හා

(ආ). මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල බර වාහන පැදවීම සඳහා වූ මොටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

හා

(ඇ). මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව මෝටර් රථ ධාවනය පිළිබඳ වසර තුනකට (03) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය වේ.

සටහන: **1.** ජාතික තරුණ සේවා සභාව විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වීම.

**19. කාර්මික මෝටර් රථ - (PL -3) - පුරප්පාඩු සංඛ්‍යාව - 02 (වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත)**

- සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **මෝටර් රථ කාර්මික ශිල්පය / වාහන විදුලි ශිල්ප** ක්ෂේත්‍රයට අදාළව කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) හතර (04)** වන මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් හෝ ලබා තිබීම.

**20. කාර්මික (නඩත්තු) - (PL -3) - පුරප්පාඩු සංඛ්‍යාව 02 - (වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත)**

- සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **වායුසමීකරණ / විදුලි උපකරණ / ජලනල කාර්මික / වඩු කාර්මික / පෙදරේරු** ක්ෂේත්‍රයට අදාළව කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) හතර (04)** වන මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**21. කාර්මික (ආලෝකකරණ) - (PL -3) - පුරප්පාඩු සංඛ්‍යාව 1 - (වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත)**

- සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **විදුලි කාර්මික හා ආලෝකකරණය** ක්ෂේත්‍රයට අදාළව කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) හතර (04)** වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**22. කාර්මික (විදුලි ජනන යන්ත්‍ර) - (PL -3) - පුරප්පාඩු සංඛ්‍යාව 01 - (වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත)**

- සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **යාන්ත්‍රික ශිල්ප** ක්ෂේත්‍රයට අදාළව කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) හතර (04)** වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**23. කාර්මික (පල්දෝරු යන්ත්‍ර) - (PL -3) - පුරප්පාඩු සංඛ්‍යාව 02 - (වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත)**

- සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **විදුලි / යාන්ත්‍රික ශිල්ප** ක්ෂේත්‍රයට අදාළව කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) හතර (04)** වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් හෝ ලබා තිබීම.

**24. කාර්මික (පිහිනුම් තටාක යන්ත්‍ර) - (PL -3) - පුරප්පාඩු සංඛ්‍යාව 01 -** (වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත)

- සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **විදුලි / යාන්ත්‍රික ශිල්ප** ක්ෂේත්‍රයට අදාළව කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) හතර (04)** වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**25. විදුලි කාර්මික - (PL -3) - පුරප්පාඩු සංඛ්‍යාව 02 - (වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත)**

- සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් **විදුලි කාර්මික ශිල්ප** ක්ෂේත්‍රයට අදාළව කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා **(NVQ) හතර (04)** වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- වයස් සීමාව

❖ අවුරුදු 18 ට නොඅඩුව හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- වැටුප් හා දීමනා.

**PL – 3 – 01/2025: රු: 43,280 – 10 X 490 – 10 X 540 – 10 X 590 – 12 X 630 – 67,040/-**

**26. සංචාරක බංගලා භාරකරු - (PL -2) - පුරප්පාඩු සංඛ්‍යාව 01**

- සුදුසුකම්

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද **ආහාර පිසීම හා සංචාරක බංගලා කළමනාකරණය පිළිබඳ** ජාතික වෘත්තීය කුසලතාව **(NVQ) දෙවැනි (02)** මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- වයස් සීමාව

❖ අවුරුදු 18 ට නොඅඩුව හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- වැටුප් හා දීමනා.

**PL – 2 – 01/2025: රු: 42,300 – 10 X 490 – 10 X 540 – 10 X 590 – 12 X 630 – 66,060/-**

**27. කාර්යාල කාර්ය සහායක - (PL -1) - පුරප්පාඩු සංඛ්‍යාව 20**

- සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම.

- වයස් සීමාව

❖ අවුරුදු 18 ට නොඅඩුව හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- වැටුප් හා දීමනා.

**PL – 1 – 01/2025: රු: 40,500 – 10 X 450 – 10 X 490 – 07 X 540 – 15 X 590 – 62,530/-**

- **01/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන අනුව පත්වීම් ලබන දින සිට ඉහත වැටුප් පරිමාණයට හිමිකම් ලබන අතර, අදියර තුනකදී සිදුවන වැටුප් වැඩිවීම අනුව පත්වීම් ලබාදෙන වර්ෂයට අදාලව තනතුරට හිමි වැටුප සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.**

- **ස්ථිර තනතුරකි.සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.**

- **අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය :- 2026.02.03**

- **පොදු කොන්දේසි**

➢ ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතුය

➢ විශිෂ්ඨ චරිතයකින් හෙබි විය යුතුය

➢ ජාතික තරුණ සේවා සභාව වෙබ්අඩවිය වන **nysc.lk** වෙත ගොස් ඉහත තනතුරු සඳහා මාර්ගගත (online) ක්‍රමයට අයදුම්පත සම්පූර්ණ කළ යුතුය

➢ අයදුම්කරු විසින් මාර්ගගත අයදුම්පතේ ඇතුළත් කරනු ලබන ජංගම දුරකථන අංකය වෙත සිදුකරනු ලබන සියලුම දැනුම්දීම් SMS මඟින් එවනු ලබන බැවින්, අයදුම්කරු වෙත එම තොරතුරු ලබා ගත හැකි ජංගම දුරකථන අංකයක් යෙදිය යුතුවේ

➢ එක් අයදුම්කරුවකු හට පුරප්පාඩු පවතින තනතුරු කිහිපයක් සඳහා සුදුසුකම් පවතින්නේ නම් එම එක් තනතුරක් සඳහා ඉදිරිපත් කළ හැකි වන්නේ එක් අයදුම්පතක් පමණි. (එක් තනතුරක් සඳහා අයදුම්පත් කිහිපයක් යොමු කිරීම එම තනතුරට අදාලව ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන සියළුම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් බව සඳහන් කරමි)

➢ සම්පූර්ණ කරන ලද තොරතුරු නිවැරදි හා දී ඇති උපදෙස් පරිදි සම්පූර්ණ කර තිබේ දැයි පරීක්ෂා කර තහවුරු කරන්න

➢ අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු, එය බාගත කර (Download), මුද්‍රිත පිටපතක් (Printout) ලබා ගෙන අත්සන සහතික කිරීමෙන් අනතුරුව , **පසුව කරනු ලබන විමසීම් සඳහා එහි පිටපතක් ළඟ තබාගත යුතුය**

➢ **අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සහිත මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් නොකිරීමට වග බලා ගත යුතුවේ**

➢ අයදුම්පත් මාර්ගතව යොමු කළ පසු එහි සඳහන් වන තොරතුරු කිසිදු හේතුවක් මත පසුව වෙනස් කරනු නොලැබේ. එබැවින් අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ පූර්ණ වගකීම වේ

➢ අයදුම්පතේ මුද්‍රිත පිටපතේ සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ

➢ ඉල්ලුම්කරන තනතුරට අදාල කාර්යභාරය මැනවින් ඉටුකිරීමට හැකි, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයක් තිබිය යුතු අතර, **ආයතනයේ කටයුතු පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය තනතුරු සඳහා වන බඳවා ගැනීම හේතුවෙන් පුරප්පාඩු පවතින දිස්ත්‍රික්වල, කාර්යාල සඳහා අවම වශයෙන් වසර 05 ක සේවය සඳහා අනුයුක්ත කරනු ලැබේ.**

➢ ආයතනයෙහි පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ දැන්වීම් පලකිරීම මඟින් හා ජාතික තරුණ සේවා සභාවේ වෙබ් අඩවියේ පලකිරීම මඟින් අයදුම්පත්

කැඳවීමෙන් පසුව ඒ ඒ තනතුරට අදාළ වන පරිදි වූ ලිඛිත තරඟ විභාගයක් හා / හෝ පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මඟින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**සභාපති / අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික තරුණ සේවා සභාව,**
**අංක 65, හයිලෙවල් පාර,**
**මහරගම.**